**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**පුවත්පත් නිවේදනය**

සෞඛ්‍ය අමාත්‍යතුමා හා ඉන්දියානු මහ කොමසාරිස්තුමා විසින් මෙඩිකෙයා 2019 (Medicare 2019) ප්‍රදර්ශනය BMICH හිදි විවෘත කෙරේ.

සහයෝගිතාවය සාර්ථකත්වයට මහ පාදන බව මහ කොමසාරිස්තුමා පවසයි.

ශ්‍රී ලංකාවේ ජාතික සුවසේවා ප්‍රදර්ශනය වන "මෙඩිකෙයා" ප්‍රදර්ශනය 10 වන වරටත් 2019 මාර්තු මස 01 වන දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා හා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා විසින් විවෘත කරන ලදී. සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ගරු ෆයිසාල් කාසිම් මැතිතුමා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත වෛද්‍ය රාසියා පෙන්ඩ්සේ මහත්මිය, ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යංශයේ නිලධාරීන සහ සෞඛ්‍ය සේවයට සම්බන්ධ වෘත්තිකයින් රැසක්ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා මෙරට සෞඛ්‍ය කේෂ්ත්‍රයේ මෑත කාලීන ජයග්‍රහණ පිළිබඳව මෙහිදි දීර්ඝ ලෙස අදහස් පළ කළේය.

මෙම අවස්ථාවේ අදහස් දැක්වූ මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ ලෙඩ රෝග වලට සීමා මායිම් නොමැති හෙයින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අපගේ සහයෝගිතාවයද දේශසීමා ඉක්මවා යා යුතු බවයි. සහයෝගිතාවය සාර්ථකත්වයට මග පාදන බව එතුමා අවධාරණය කළේය. සෞඛ්‍ය ක්ෂේත්‍රය

තුළ ශ්‍රී ලංකාව ලබා ඇති ජයග්‍රහණ අගය කළ මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශක සංවර්ධිත රටවල සෞඛ්‍ය දර්ශකයන්ට සමාන බව පෙන්වා දුන්නේය. එකට එක්ව නවෝත්පාදන සිදු කිරීමට හා වර්ධනය වීමට ඉන්දීය
සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සිදුවන පරිවර්තනීය වෙනස්කම් අවස්ථාවන් රැසක් ලබා දී ඇති බවද එතුමා සඳහන් කළේය.

2018 මාර්තු මාසයේදී BMICH හිදී පවත්වන ලද මෙඩිකෙයා ප්‍රදර්ශනයද සමාරම්භ කරන ලද්දේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා හා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා විසිනි.

මෙඩිකෙයා ප්‍රදර්ශනය ඉන්දියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (FICCI) සමඟ එක්ව සංවිධානය කර ඇත. ඉන්දියාවෙන් පැමිණි සමාගම් 40 කට අධික සංඛ්‍යාවක් ඇති ඉන්දියානු මණ්ඩපයක්ද මහ කොමසාරිස්තුමා විසින් විවෘත කරන ලදී. 2019 මාර්තු 1-3 දින දක්වා BMICH හිදී මෙඩිකෙයා ප්‍රදර්ශනය පැවැත්විණ.

කොළඹ
2019 මාර්තු 05